| 65. | | පියන් සහිත ජනෙල් 03යි, (ඇඹි/මහේ/අධිකරණයේ ගොඩනැගිලි අලුත් වැඩියාවේ දී ඉවත් කරන ලද ද්‍රව්‍ය) |
| 66. | | දොරවල් 01යි, (ඇඹි/මහේ/අධිකරණයේ ගොඩනැගිලි අලුත් වැඩියාවේ දී ඉවත් කරන ලද ද්‍රව්‍ය) |
| 67. | | උළු තොගය (ඇඹි/මහේ/අධිකරණයේ ගොඩනැගිලි අලුත් වැඩියාවේ දී ඉවත් කරන ලද ද්‍රව්‍ය) |
| 68. | | දැව කොටස් තොගය (ඇඹි/මහේ/අධිකරණයේ ගොඩනැගිලි අලුත් වැඩියාවේ දී ඉවත් කරන ලද ද්‍රව්‍ය) |
| 69. | | සිවිලින් පෑන් 03යි. (ඇඹි/මහේ/අධිකරණයේ ගොඩනැගිලි අලුත් වැඩියාවේ දී ඉවත් කරන ලද ද්‍රව්‍ය) |
| 70. | | සිවිලින් ෆෑන් 03යි. (ඇඹි/මහේ/අධිකරණයේ ගොඩනැගිලි අලුත් වැඩියාවේ දී ඉවත් කරන ලද ද්‍රව්‍ය) |
| 71. | | යූ. පී. එස්. 05යි. (ඇඹි/මහේ/අධිකරණයේ ගොඩනැගිලි අලුත් වැඩියාවේ දී ඉවත් කරන ලද ද්‍රව්‍ය) |
| 72. | | ලී පුටු 10යි. (ඇඹි/මහේ/අධිකරණයේ ගොඩනැගිලි අලුත් වැඩියාවේ දී ඉවත් කරන ලද ද්‍රව්‍ය) |

01-72

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### මහජන බැංකුව - කැළණිය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 266 දකුණු තලවතුහේන්පිට ග්‍රාම නිලධාරි වසමේ, දකුණු තලවතුහේන්පිට ගමේ පිහිටි මිදෙල්ලගහකුඹුර, මිල්ලගහකුඹුර නොහොත් ගුරුන්නාන්සේලාගේ කුඹුර සහ මිල්ලගහකුඹුර ලොට් 2 D නමැති ඉඩමට බලයලත් මානක කේ. ඩී. ඩබ්. ඩී. පෙරේරා මහතා විසින් 2015.08.27 වැනි දින සාදන ලද අංක 15197 පිඹුරට අනුව ලොට් අංක 2 D නමැති ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : පර්. 9.25 විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි සියලු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 205/94 හි ලියාපදිංචි කර ඇත. ඉහත කී පිඹුරේ පාරවල් සඳහා වෙන් කළ කොටස්වල මාර්ග අයිතිය ද සමග වේ.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් **2023 ජනවාරි මස 24 වැනි අඟහරුවාදා දින පෙ. ව. 11.00** ට මහජන බැංකුව කැළණිය ශාඛා පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID -19 ක්‍රියා පිළිවෙතට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලවම පවත්වනු ලැබේ.

රජයේ ගැසට් පත්‍රයේ 2021.10.22 දින ද, ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 2021.09.17 දින ද, පලකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.-* කිරිබත්ගොඩ කලර් ලයිට් හන්දියේ සිට මාවරමන්ඩිය පාරේ ''උදේශි සිටි'' ගොඩනැගිල්ල හමුවන තුරු මීටර් 225ක් පමණ ගමන් කරන්න. එතැනින් දකුණට ඇති රෝයල් ෆාම් ගාර්ඩන් පාරට හැරී එහි මීටර් 150ක් පමණ ගොස් වමට හැරී මීටර් 25ක් පමණ ගමන් කරන්න. එහි දී දකුණට ඇති කොන්ක්‍රීට් පාරේ මීටර් කිහිපයක් ගිය විට පාරේ දකුණු පසින් අදාළ දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය. -* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුලු මුදල්, මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% (සියයට එකක්),
3. වෙන්දේසිකරුගෙත් කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2ක් (සියයට දෙකහමාරක්),
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,500.00ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කළමණාකරු මහජන බැංකුව කැළණිය ශාඛාව වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් පරිදි, සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක.

ප්‍රාදේශීය කළමනාකාර,
මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර, මුදුන්ගොඩ.

දුරකථන අංක 033 - 2222325, 033- 2225008, 033 - 2231901
ෆැක්ස් අංකය : 033 - 2226165, 033 - 2226741.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය''.

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 131 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය :*
6 A, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

01- 03

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.- පරණ යොන් වීදිය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ කන්දයියා චරවන්දිරන් ණයකරු වශයෙන් ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. එස්. ජයවීර විසින් දෙකම සහතික කරන ලද 2018 සැප්තැම්බර් මස 28 වැනි දින දරන අංක 3693 සහ 2019 නොවැම්බර් මස 28 වැනි දින දරන අංක 3994 දරන උකස් බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත උකස් කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම්පත්තුවේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ, අංක 177 මත්තුමගල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මත්තුමගල ග්‍රාමයේ පිහිටි ''කෝන්ගහවත්ත'' ලෙස හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වඩ් විසින් සාදන ලද 2016.10.04 දිනැති අංක 7176 B දරන සැලැස්මේ ලොට් 01 ලෙස දක්වා බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලුම දේ සමග එකී අංක 7176 B දරන සැලැස්මට අනුව ඉඩමේ ප්‍රමාණය පර්චස් දහයයි දශම අටයි බිංදුවක් (පර්. 10.80) වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව L 363/83 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉඩම ප්‍රමාණයෙන් පර්චස් 10.80කි. (පර්. 10.80) එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලුම දේ සමග ඉඩම කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී විසින් මා වෙත පවරන ලද බලතල අනුව **2023 පෙබරවාරි මස 07 වැනි දින පෙරවරු 10.00** ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කොළඹ මීගමුව මාර්ගය ඔස්සේ මහබාගේ හංදිය දක්වා පැමිණ, වම් පසට ඇති බණ්ඩාරනායක පාරට හැරෙන්න. එම බණ්ඩාරනායක පාර දිගේ තවත් මීටර් 200 ක පමණ දුරක් ගොස් වම් පසට ඇති නමක් සඳහන් කර නොමැති මාර්ගයට හැරී තවත් මීටර් 65 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ දකුණු පසින් පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - රජයේ ගැසට් පත්‍රයේ 2022.10.14 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප, ඩේලිමිරර් සහ තිනකුරල් යන පුවත්පත්වල 2022.10.12 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,500, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක

මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

වැඩි විස්තර සඳහා විමසන්න. - කළමනාකරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී, අංක 442/A, පරණ යෝන් වීදිය, කොළඹ 12. දුරකථන අංක 011- 2422285, 011- 2345554.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

එම්. එච්. ටී. කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංකː 011- 3068185, 011- 2572940.

01-04

---

HNB 74 - 2022

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.- කළුතර ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට කළුතර ප්‍රසිද්ධ නොතාරිස් වයි. එන්. පී. ද සිල්වා විසින් ලියා සහතික කරන ලද අංක 2401 හා 2018 ඔක්තෝබර් මස 10 දින දරන උකස් බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම, උඩවත්තගේ උදේශ් රංග සිල්වා ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ වර්ෂ **2023**ක් වූ ජනවාරි මස **26** වැනි දින පෙ. ව. **10.30** ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණ උතුරේ කළුතර බැද්දේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ 727 ඒ - අටවිල ග්‍රාම නිලධාරි වසම තුළ මහහීනටියන්ගල පිහිටි නාගොඩ එස්ටේට් හි කොටස නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. එල්. විජේනායක විසින් සාදන ලද අංක 1210 හා 1999.10.22 දින දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මෙම ඉඩමේ ලොට් එල් (දිසා අධිකරණයේ පී 5328 හි ගොනු වී ඇති) ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ම ලොට් පී සහ 3 ද, දකුණට : ලොට් 2 සහ 3 සහ බස්නාහිරට : අංක 1153 දරන පිඹුරේ ලොට් 2 සහ ලොට් 4 ද මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් බින්දුවයි දශම හයයි තුනක් (අක්. 0, රූ. 1, පර්. 0.63) විශාලත්වයෙන් යුත් ඉඩම වේ.

එකී ඉඩම මෑතකදී මැනීමකට ලක් කරන ලද අතර, එය බලයලත් මිනින්දෝරු ලසන්ත හේවාගම විසින් සාදන ලද අංක 354 හා සහ 2013.02.06 දින දරන පිඹුරේ පෙන්වා ඇති අතර, එය පහත සඳහන් පරිදි විස්තර කර තිබේ.

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණ උතුරේ කළුතර බැද්දේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ 727 ඒ - අටවිල ග්‍රාම නිලධාරි වසම තුළ මහහීනටියන්ගල පිහිටි නාගොඩ එස්ටේට් හි කොටස නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ලසන්ත හේවාගම විසින් සාදන ලද අංක 354 හා 2013.02.06 දින දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : මෙම ඉඩමේ ලොට් එල් (දිසා අධිකරණයේ පී 5328 හි ගොනු වී ඇති) ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ම ලොට් පී සහ අංක 1210 දරන පිඹුරේ මෙම ඉඩමේ ම ලොට් 3 ද, දකුණට : අංක 1210 දරන පිඹුරේ මෙම ඉඩමේ ම ලොට් 2 සහ 3 සහ බස්නාහිරට : අංක 1210 දරන පිඹුරේ මෙම ඉඩමේ ම ලොට් 4 සහ 2 සහ අංක 1153 දරන පිඹුරේ ලොට් 2 ද, මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් බින්දුවයි දශම හයයි තුනක් (රූ. 1, පර්. 0.63) විශාලත්වයෙන් යුත් ඉඩම වේ.

තවද, බලයලත් මිනින්දෝරු කේ. ඩී. එල්. විජේනායක විසින් සාදන ලද අංක 1210 සහ 1999.10.22 දින දරන පිඹුරේ ලොට් 4 සහ 5 වශයෙන් ලකුණු කර ඇති මාර්ගය සඳහා වෙන් කිරීම මතින් හා දිගේ වන මාර්ග අයිතිය සහ ඒ හා සමාන අනෙකුත් අයිතිවාසිකම් ද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2022.11.04 දින දරන රජයේ *ගැසට් පත්‍රය* හා 2022.11.23 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.* - කළුතර ඔරලෝසු කනුව හන්දියේ සිට නාබොඩ මාර්ගය දිගේ කි. මී. 04ක් පමණ වන තුරු පී. ටී. එස්. හන්දිය දක්වා ගොස් එතැනින් දකුණට හැරී හීනටියන්ගල පාරේ

මීටර් 700ක් පමණ ගමන් කොට ''ලැව්නියා ප්‍රොපටීස්'' නම් සංවර්ධන ඉඩම දක්වා ළගා වී ඉන් අනෙක් අත පැත්තෙන් දකුණට හැරී නාගොඩවත්ත පාරට පිවිසෙන්න. එම පාරේ මීටර් 50ක් පමණ ගමන් කළ පසු හමුවන අඩි 15ක් පමණ පළල පාරට දකුණට හැරී තවත් මීටර් 50ක් පමණ ගමන් කරන්න. එම පාරේ අවසානයට වන්නට පිහිටා ඇති අඩි 10ක් පමණ පළල පාරෙන් ගොස් අදාල පිඹුරේ දක්වා ඇති දේපලට ළගා විය හැක. මෙය වාහන ගමන් කළ හැකි ගමන් මාර්ගයකි.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් (2.5%) ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහසක් (රු. 2,000) ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500) ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනුවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදල ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු, (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන අංක : 011 - 2661826, 2661835.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා,
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත,
පටුවත, දෙඩන්දූව.
දුරකතන අංක : 071 - 3358434, 0779- 663420
Email : ejayawardhana77@gmail.com

01-10

## පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියේ විකිණීමයි

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ වර්ෂ **2023ක් වූ ජනවාරි මස 26 වැනි දින පෙ. ව. 10.00 ට** එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, (ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සහ බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මාකොළ දකුණ 271 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාකොළ දකුණ ගමෙහි පිහිටා ඇති කිරිබත්ගොඩ පාර, වරිපනම් අංක 367/5 දරන ''ගලබොඩවත්ත' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වී. ගාමිණී විතාන විසින් මැන සාදන ලද 2019.09.02 දිනැති පිඹුරු අංක 1111 දරන පිඹුරෙහි ලොට් අංක 1 යනුවෙන් ලකුණු කර ඇති ඉඩම සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේත් වේ.

(බිම් ප්‍රමාණය පර්. 14.65)

*දේපළට පිවිසෙන මාර්ගය.*- කොළඹ සිට නුවර පාරේ කිරිබත්ගොඩ නගරය දක්වා ගමන් කර එතැන් සිට දකුණට හැරී මාකොළ පාරේ ගමන් කළ යුතු ය. එම පාරේ තවත් කිලෝමීටර් 1.7ක් පමණ ගමන් කළ විට දකුණු පසින් පැත්තට ඇති අඩි 10ක් පමණ පළල බොරළු පාරට හැරී මීටර් 50ක් පමණ ගමන් කළ පසු වම් අත පැත්තේ විෂයගත දේපළ පිහිටා ඇත.

කහව දඩල්ල හේවගේ චින්තක බන්ධනදායි සහ උකස්කරු වශයෙන් ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. එන්. චන්ද්‍රිමා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2020.01.14 දිනැති අංක 877 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය* - සඳහා වර්ෂ 2022.11.08 වැනි දින, දි අයිලන්ඩ්, දිවයින, තිනක්කුරල් පුවත්පත් සහ වර්ෂ 2022.11.04 වැනි දින ගැසට් පත ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
6. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500 ද,

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු කළමණාකරු - ණය අයකර ගැනීම් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී., ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක 011 - 4667220, 011 - 4667237

තුසිත් කරුණාරත්න,
උසාවි කොමසාරිස් සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3(50/3), විහාර මාවත,
කොලොන්නාව.
දුරකථන අංක : 011- 3068185
ෆැක්ස් අංකය : 011- 2572940

01- 74

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ෆෙයාර්වේ මිනර්වා (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0122 1000 4600.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.11.28 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එකසිය හතර කෝටි හතලිස් හත් ලක්ෂ විසි එක් දහස් නමසිය හැත්තෑ හතයි ශත හැට තුනක (රු. 1,044,721.977.63) මුදල ද, 2019 නොවැම්බර් මස 05 දින සිට අංක 1306 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුලුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් කෝටි සියයක (රු. 1,000,000,000.00) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate + Two decimal Five per centum (2.5%) per annum බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.12.20 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.12.12 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2023.01.27** වැනි දින **පෙ. ව. 10.00** ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන කේ. පී. එන්. සිල්වා යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, C 31 පිටකොටුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කෙහෙල්වත්ත, වෝඩ් අංක 18, අලුත්කඩේ පිහිටි ඕල්කොට් මාවත, වරිපනම් අංක 341, 341/1 දරන පරිශ්‍රයන් බලයලත් මානක තැන කේ. ජී. සී. කුලවංස යන අය විසින් සාදන ලද 2013 සැප්තැම්බර් මස 25 දාතම හා අංක 47-2013 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ඇති ලොට් X වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 331 දරන පරිශ්‍රයන්, ඕල්කට් මාවත (පොලිස් නිල නිවාස) සහ වරිපනම් අංක 8 සහ 10 දරන පරිශ්‍රයන්, ට්‍රිනිටි පෙදෙස (මිහිඳු විද්‍යාලය), නැගෙනහිරට : වරිපනම් අංක 8 සහ 10 දරන පරිශ්‍රයන්, ට්‍රිනිටි පෙදෙස (මිහිඳු විද්‍යාලය) සහ එම්. ඩී. ගුණසේන මාවත, දකුණට : පාර සහ ඕල්කට් මාවත සහ බස්නාහිරට : ඕල්කොට් මාවත සහ වරිපනම් අංක 331 දරන පරිශ්‍රයන්, ඕල්කොට් මාවත (පොලිස් නිල නිවාස) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් පහයි දශම දෙකයි පහක් (A:0, R:3, P:5.25) විශාල ඉඩම් කොටස එකී අංක 47-2013 දරන පිඹුරට අනුවය.

*එකී ලොට් X පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, C 31 පිටකොටුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සෙන් සෙබස්තියන් වෝර්ඩ් හි පිහිටි වරිපනම් අංක 341 දරන බලයලත් මානක තැන පී. ආර්. බොතේජු යන අය විසින් සාදන ලද 1946 නොවැම්බර් මස 29 දාතම හා අංක 3 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ඇති ලොට් C1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : වරිපනම් අංක 331 දරන පොලිස් නිල නිවාස, (නොරිස් පාර), වරිපනම් අංක 8 සහ 10 දරන ට්‍රිනිටි දෙව්මැදුර පරිශ්‍රයන්, ට්‍රිනිටි පෙදෙස, නැගෙනහිරට : ලොට් C2, දකුණට : වරිපනම් අංක 343 දරන ලොට් D (නොරිස් පාර) සහ බස්නාහිරට : (නොරිස් පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් විස්සක් (A:1, R:0, P:20) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ එකී අංක 3 දරන පිඹුරට අනුව D 181/122 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01-95

**ලංකා බැංකුව - අධිශ්‍රේණි ශාඛාව, රත්නපුර**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරිය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ණය යොමු අංක - 80139385/83233591

රත්නපුර, අංගම්මන පාර, අංක 122/3 හි පදිංචි කුඩා විදානෙලාගේ හිමාල් නයනප්‍රිය සේනාරත්න මහතා සහ හීතක පද්මා විජේවර්ධන මහත්මියට අයත් උකස් කරන ලද ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2022 නොවැම්බර් මස 11 වැනි දින 2306 දරන ගැසට් පත්‍රයේ හා 2022 නොවැම්බර් 02 වැනි බදාදා දින ''දිනමිණ'' ''තිනකරන්'' හා ''ඩේලිනිව්ස්'' යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදී ම **2023 ජනවාරි මස 26 වැනි දින බ්‍රහස්පතින්ද දින පෙ. ව. 11.00 ට** ෂොක්මන් සහ සමරවික්‍රම වෙන්දේසිකාර ආයතනයේ වෙන්දේසිකරු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

උකස් සාධන පත්‍රය (2018.09.27 සහ 2016.11.24 දිනැති අංක 00330054122 දරන හිමිකමේ සහතිකය)

1. ඉඩමේ විස්තරය:

(a) දිස්ත්‍රික්කය : රත්නපුර
(b) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : රත්නපුර
(c) ග්‍රාම නිලධාරි කොට්ඨාසය : අංගම්මන
(d) ග්‍රාමය හෝ නගරය : බටුගෙදර
(e) වීදිය :
(f) වරිපනම් අංකය :
(g) මහමාර්ග සිතියම් අංකය : 620292
(h) බිම් කට්ටි අංකය : 05
(i) කොටස් අංකය : 0087
(j) ප්‍රමාණය : හෙක්ටයාර් 0.0485
(k) සහාධිපත්‍ය දේපලක් නම් ඒකකයෙහි අංකය :..............

1. කලින් ලියාපදිංචියෙහි යොමුව

(a) ලියාපදිංචියේ ස්ථානය : රත්නපුර
(b) හිමිකම් සහතික අංකය : 00330054122
(c) හිමිකමේ පන්තිය : පළමු පන්තිය

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. කේ. ස්වර්ණතිලකා,
ප්‍රධාන කළමණාකාරිණී,
ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
රත්නපුර.

2022 දෙසැම්බර් මස 20 වැනි දින.

01-115

---

**සෙලාන් බැංකුව පීඑල්සී - වේයන්ගොඩ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වේයන්ගොඩ පදිංචි දිමුති ටෙරන්ස් පුෂ්ප කුමාර සිල්වා අය අය බන්ධනදයි/උකස්කරු වශයෙන් මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. ආර්. ජනක වෙල්ලප්පිලි විසින් සහතික කරන ලද 2018.12.21 දිනැති උකස් බැඳුම්කර අංක 1670 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ

වර්ෂ **2023ක් වූ ජනවාරි මස 30 වැනි දින පෙ. ව. 11.00 ට** සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරන ලද බලය ප්‍රකාරව කොළඹ 03, ගාලු පාර, අංක 90 හි පිහිටි සෙලාන් බැංකුව පීඑල්සී පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID -19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ දසියා පත්තුවේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ මාරපොල අංක 129 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මාරපොල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. කේ. ඒ. එස්. පද්මිනි විසින් සාදන ලද 2018 .09.05 දිනැති අංක 15819 සැලැස්මේ නිරූපනය වන මාරපොල එස්ටේට් නමැති ඉඩමේ ලොට් X ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (පර්. 15) ක් විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් සාදන ලද අංක 6524 සැලැස්මේ සඳහන් ලොට් 35 සහ ලොට් 12 ලෙස ලකුණු කළ පාර සඳහා වෙන් කිරීම් තුළ උඩින් සහ දිගේ මාර්ග ප්‍රවේශය සමග.

*දේපල පිවිසීම.* - වේයන්ගොඩ සෙලාන් බැංකු පරිශ්‍රයේ සිට වේයන්ගොඩ - මීගමුව පාර ඔස්සේ 3.1 kmsක් නයිවල හතරමං හන්දිය දක්වා පැමිණ වමට ඇති නයිවල උඩුගම්පොල පාරෙන් 1.4kms ක් පැමිණ දකුණු පසින් ඇති පාරක් සඳහා වෙන් කරන ලද ස්වර්ණවිමන ලෙසින් නම්කර ඇති කොන්ක්‍රීට් පාරෙන් මීටර් 150ක් ගොස් දකුණට ඇති අඩි 15ක් පළල බොරලු පාරෙන් මීටර් 15ක් ගිය පසු දකුණට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - 2022.12.02 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, අද, ඩේලි මිරර් සහ තමිලන් පුවත්පත්හි 2022.12.02 දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% 2. පළාත් අධිකාරියේ බදු සඳහා 1%, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5% 4. විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500, 5. ලිපිකරු සහ සෝෂකගේ ගාස්තුව , 6. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, හෝ ගාස්තු වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත සෙලාන් බැංකුව පීල්සී වෙත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරිනී - නීති 14 මහළ, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක 011 2456475, 011- 2456479.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

නො. 9, අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ,
හෝමාගම.

දුරකතන අංක 071 4318252 - 011- 2173282.

01-109

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2023 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2023.01.05 | බ්‍රහස්පතින්දා | 2022.12.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.01.13 | සිකුරාදා | 2022.12.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.01.20 | සිකුරාදා | 2023.01.05 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2023.01.27 | සිකුරාදා | 2023.01.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2023.02.03 | සිකුරාදා | 2023.01.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.02.10 | සිකුරාදා | 2023.01.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.02.17 | සිකුරාදා | 2023.02.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.02.24 | සිකුරාදා | 2023.02.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2023.03.03 | සිකුරාදා | 2023.02.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.03.10 | සිකුරාදා | 2023.02.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.03.17 | සිකුරාදා | 2023.03.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.03.24 | සිකුරාදා | 2023.03.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.03.31 | සිකුරාදා | 2023.03.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.